# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ඇති වී ඇති / ඇතිවීමට නියමිත පුරප්පාඩු සඳහා සාමාජිකයන් පත් කිරීම සඳහා පහත දැක්වෙන එක් එක් සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද වලින්, නාම යෝජනා කැඳවනු ලැබේ.

- ශ්‍රී ලංකා නීතිඥ සංගමය (නීතිඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නාමයෝජනා ඉදිරිපත් කළයුතු අතර, යෝජිත තැනැත්තන් නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥවරයන් හෝ නීති විශාරදයන් විය යුතුය)
- ප්‍රකාශකවරුන්ගේ, කතෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන ;
- වෙනත් සිවිල් සමාජ සංවිධාන ;

***එකී නාමයෝජිත තැනැත්තන්,***

- නීතිය, පාලනය, රාජ්‍ය පරිපාලන, සමාජ සේවා, පුවත්පත් කලාවේදී, විද්‍යා හා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනීමක්, ඇත්දැකීම් හා ප්‍රවීණත්වය සහිත පොදු ජන ජීවිතයේදී සුවිශේෂී තැනැත්තන් විය යුතුය.

***තවද එකී තැනැත්තන්,***

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු ;
- යම් රාජ්‍ය හෝ අධිකරණ ධූරයක් හෝ වෙනත් ලාභදායී ධූරයක් දරන තැනැත්තන් ;
- යම් දේශපාලන පක්ෂයකට සම්බන්ධ තැනැත්තන් ;
- යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන හෝ යම් වෘත්තියක යෙදෙන තැනැත්තන් ;

නොවිය යුතුය.

නාමයෝජනා ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබන සංවිධාන සහ ආයතනයන් විසින්, පාර්ලිමේන්තු සභාවේ සලකා බැලීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් තිදෙනෙකු යෝජනා කළ යුතුවේ. ඉහත නාමයෝජනා එම සංවිධාන මගින් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමග එසේ ඉදිරිපත් කරන තැනැත්තන්ගේ ජීව දත්ත සටහන 2021 ඔක්තෝබර් මස 19 දින හෝ එදිනට පෙර ලැබෙන සේ,

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්,**
**පාර්ලිමේන්තු සභාව,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ parliamentarycouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ / විද්‍යුත් ලිපියෙහි විෂය වශයෙන් '**තොරතුරු දැනැගනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම**' යනුවෙන් සඳහන් කරන්න.

පාර්ලිමේන්තු සභාවේ නියමය පරිදි පළකරන ලදී.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**2021.09.30**